*සැ. යු.* - 2021.02.05 වැනි දින පළ වූ අංක 2,214 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,215- 2021 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2021.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 16 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 16 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 05 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

15 - B 82203 - 353 (2020/02)
E -1

# ඉඩම් ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජෝන් පිල්ලෙ සුසීන්ද්‍රන් අරුල්රාජ් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2010.04.20 වන දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි/ප්‍රාලේ/4433 දරන ප්‍රධාන පත්‍රයේ හිමිකරු වන පුලියංකුලම් යන ලිපිනයේ පදිංචි, සෙල්වරාසා කෝනේසරාසා වෙත ප්‍රධානය කොට ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් කාර්යාලයේ අංක එල්ඩී/රිජී/53/17 යටතේ 2011.10.02 වන දින ලියාපදිංචි කර ඇත.

පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකැමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ නගර හා කඩවත් පත්තුවේ පුලියංකුලම් 243 එල් ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පුලියංකුලම් නමැති ගමේ පිහිටා ඇති සර්වේජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක එෆ්. වී. පී. 27 දරන පිඹුරෙහි අංක 936 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0475 රූඩ් 0, පර්චස් 00 ක් ඇතැයි ගණන් බලා තිබෙන පුලියංකුලම් යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| උතුරට | : කැබලි අංක 937 න් කොටස |
| නැගෙනහිරට | : කැබලි අංක 935 |
| දකුණට | : කැබලි අංක 937 න් කොටස |
| බස්නාහිරට | : කැබලි අංක 937 |

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්.

2020 ජුනි මස 12 වැනි දින,
නගර හා කඩවත් ත්‍රිකුණාමලය.

02-213

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/62354.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L-6/හිඟු/04/(1)

21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 29, මොරගස්වැව ග්‍රාම නිලධාරී වසමේ ත්‍රිසිංහගම ගමේ ජනපද නිලධාරී විසින් අඳින ලද අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 ක ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා වැලිසරගේ හර්මන් නිමල් ප්‍රනාන්දු මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| උතුරට | : මාර්ග රක්ෂිතය |
| නැගෙනහිරට | : ජයසේන හා ටී. ඒ. එස්. බී. තෙන්නකෝන් භුක්ති විඳින ඉඩම |
| දකුණට | : විදුලි වැට රක්ෂිතය හා කැලය |
| බටහිරට | : විදුලි වැට රක්ෂිතය හා කැලය |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* : අවුරුදු තිහයි (30) (2020.08.02 සිට 2050.08.01 දක්වා)

*වාර්ෂික බදු මුදල* : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාද ඇති සහ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හීදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පල කල දින සිට සති 06 ක් ඇතුළතදී අදාල ඉඩම් බදු නොදිය යුතු බ වට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-166

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63831

පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/KB/LTL/12

## 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1323, කහටගස්වැව ග්‍රාම නිලධාරී වසමේ කහටගස්වැව ගමේ අ.ග.පි. 1593 පිඹුරේ කැබලි අංක 69 දරන ප්‍රමාණයෙන් අක්කර 14, රූඩ් 02,පර්. 20 ක් වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ආර්. පී. සී. ප්‍රොපර්ටිස් (ප්‍රයිවට්)ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ.

*උතුරට* : බිම් කට්ටි අංක 40 සහ බිම් කට්ටි අංක 70
*නැගෙනහිරට* : බිම් කට්ටි අංක 70
*දකුණට* : බිම් කට්ටි අංක 70 සහ දංවිල ගම් මායිම
*බටහිරට* : බිම් කට්ටි අංක 40

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) බදු කාලය : අවුරුදු තිහයි (30) (2020.12.11 දින සිට වසර 30 ක් ඉදිරියට)

වාර්ෂික බදු මුදල : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) කට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2020.12.11 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළවන දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-173

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/51273
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/BAT/MN/D. Dev. Bank/6

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක පනිච්චියඩි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පනිච්චියඩි ගමේ DS/MN/LE-PLAN/je 08 අනුරේඛණයේ ප්‍රමාණයෙන් පර්. 25 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල ගොඩනැගිල්ල ඉදිකිරීමට වාණිජ කටයුතු සඳහා ග්‍රාමීය සංවර්ධන බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම පහත දැක්වේ.

උතුරට : පාර
නැගෙනහිරට : පාර
දකුණට : පාර
බටහිරට : රජයේ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) බදු කාලය : අවුරුදු තිහයි (30) (2020.11.20 දින සිට 2050.11.19 දක්වා)

වාර්ෂික බදු මුදල : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) කට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2020.11.20 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-164

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/37666.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/GAL/02/03/55 (පැරණි).

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 144 ඒ කොග්ගල ග්‍රාම නිලධාරි වසමේ කොග්ගල ගමේ මු. පි. ගා 1512 කැබලි අංක 02 හි ප්‍රමාණයෙන් හෙක්. 0.0303 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා කටපොඩි කන්කානම්ගේ වසන්ති ලක්ෂමණි විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| උතුරට | : මු. පි.ගා. 1512 හි කැබලි අංක 3 සහ 4, |
| නැගෙනහිරට | : මු. පි.A 857 හි කැබලි අංක 185, |
| දකුණට | : මු. පි. A 857 හි කැබලි අංක 185 සහ මු. පි. ගා. 1512 හි කැබලි අංක 1, |
| බටහිරට | : මු. පි. ගා. 1512 හි කැබලි අංක 1. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2020.12.28 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

(ආ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඈ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2020.12.28 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2021 පෙබරවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර''
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-214

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63816
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/TRI/T&G/207

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුතු නගර් ග්‍රාම නිලධාරි වසමේ මුතුනගර් ගමේ ජනපද නිලධාරී අනුරේඛණය දරන ප්‍රමාණයෙන් රූඩ් 03 ක ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ඩයිනමික් ටෙක්නොලොජිස් (පුද්) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| උතුරට | : රජයේ ඉඩම |
| නැගෙනහිරට | : රජයේ ඉඩම |
| දකුණට | : රජයේ ඉඩම |
| බටහිරට | : නුවර පාර |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) බදු කාලය : අවුරුදු තිහයි (30) (2020.10.26 සිට ඉදිරියට)

වාර්ෂික බදු මුදල : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව

මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.
(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.
(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.
(ඉ) සාදා ඇති සහ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.
(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.
(උ) අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක.
(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එල්. ඒ. සංජීව,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2021 පෙබරවාරි මස 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැඳුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ලේ හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

02-169

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/62058.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
සීපීසී/එල්සී/එල්ඩී/4/1/32/999.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 535ඩී, මධ්‍යම නුවරඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නුවරඑළිය ගමේ නුඑ/ප්‍රාලේ/2015/12 අනුරේඛනයේ කැබලි අංක A දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0823 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුත්තක් සඳහා සූරිය පටබැඳිගේ සරත් සුසිල් ශාන්ත විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ. :

උතුරට : සේනානායක බංගලාවට අයත් ඉඩම සහ බන්දුල සෙනවිරත්න භුක්තිවිඳින ඉඩම,
නැගෙනහිරට : බන්දුල සෙනවිරත්න භුක්තිවිඳින ඉඩම,
දකුණට : කැබලි අංක බී,
බටහිරට : කැබලි අංක බී සහ සේනානායක බංගලාවට අයත් ඉඩම.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* - අවුරුදු තිහයි (30) (2020.08.02 දින සිට අවුරුදු 30 ක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල* : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.
(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.
(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වා ගෙන යා යුතුය.
(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.
(ඊ) බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හා පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.
(උ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස් ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2021 පෙබරවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

02-168

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/61823
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :UPLC/L/18/MO/L/66

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 129 මුප්පනේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පිඹුරු අංක අ.ග.පි. 172 හි අංක MO/MNR/2010/89 දරන අනුරේඛනයේ කැබලි අංක AJ වශයෙන් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1848 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ලංකා බැංකු නිල නිවස පවත්වාගෙන යාම සඳහා වාණිජ පදනමින් ලංකා බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

උතුරට : කැබලි අංක 3329 සහ කැබලි අංක AL (රජයේ නිල නිවාස),
නැගෙනහිරට : කැබලි අංක AK (රජයේ නිල නිවාස),
දකුණට : කබැලි අංක AV දරන මාර්ගය,
බටහිරට : කැබලි අංක AV දරන මාර්ගය.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* : අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා බදු අනුමත කල 2020.08.02 සිට)
*වාර්ෂික බදු මුදල* : 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000.000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම් ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.
(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.
(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.
(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.
(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදු කරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.
(උ) ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2020.08.02 දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.
(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සමීර. පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්.
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි 12 වැනි දින
අංක 1200/6 ඉඩම් මහ ලේකම් කාර්යාලය
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-167

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/61828
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/17/MD/L/26

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන

නිවේදනය

මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 104ඒ ඉඟිනියාගල ග්‍රාම නිලධාරි වසමේ ඉඟිනියාගල ගමෙහි පිහිටි අංක මු. පි. මො. 214 පිඹුරෙහි කැබලි අංක 01න් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1628 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ආගමික කටයුතු සඳහා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ. :-

උතුරට : ගල සහ එම්. ජේ. ඇන්ටනීගේ ඉඩම,
නැගෙනහිරට : එම්. ජේ. ඇන්ටනීගේ ඉඩම සහ මාර්ගය,
දකුණට : මාර්ගය සහ ජේ. ඒ. ගෝමස්ගේ ඉඩම,
බටහිරට : ජේ. ඒ. ගෝමස්ගේ ඉඩම සහ ගල.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) බදු කාලය : අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2020.08.02 දින සිට),
වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම් ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.
(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.
(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.
(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.
(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදු කරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.
(උ) ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2020.08.02 දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.
(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සමීර. පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්.
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි මස 12 වැනි දින,
අංක 1200/6 ඉඩම් මහ ලේකම් කාර්යාලය
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-172

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58664
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/BAT/MN/22

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන

නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 176ඒ සතුරුකොන්ඩාන් ග්‍රාම නිලධාරි වසමේ සතුරුකොන්ඩාන් ගමේ දළ අනුරේඛණයෙහි ප්‍රමාණයෙන් අක්. 01ක් පමණ වන ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා ශ්‍රී පෙරින්පා ඥාණ පීඨයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

උතුරට : මාර්ගය,
නැගෙනහිරට : රජයේ ඉඩම,
දකුණට : මාර්ගය,
බටහිරට : මාර්ගය.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* : අවුරුදු තිහයි (30) යි (2020.11.20 දින සිට ඉදිරියට)
(ආ) *බදු මුදල* : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.
(ඇ) මෙම ඉඩම ආගමික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.
(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කල යුතුය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදු කරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2020.11.20 සිට අවුරුදු 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රනවන්,
සහකාර ඉඩම් කොමසාරිස්.
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි මස 12 වැනි දින
අංක 1200/6 ඉඩම් මහ ලේකම් කාර්යාලය ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-171

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/55766
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/BAT/MN/M. Chrch/19.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 176ඒ සින්න උරණි දකුණ ග්‍රාම නිලධාරී වසමේ සින්න උරණි ගමේ පි. පි. මඩ 1047 පිඹුරේ කැබලි අංක 01 ප්‍රමාණයෙන් හෙක්. 0.2800ක් පමණ වන ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා සින්න උරණි මෙතෝදිස්ත දේවස්ථානයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මෙහි පහත දක්වේ. :

උතුරට : වෙම්බුභූමි
නැගෙනහිරට : කැබලි අංක 2,වෙම්බුභූමි සහ සින්න උරණි සිට වත්ත දක්වා පාර
දකුණට : සින්න උරණි සිට වත්ත දක්වා පාර සහ වෙම්බුභූමි
බටහිරට : වෙම්බුභූමි

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(*අ*) බදු කාලය : අවුරුදු තිහයි (30) යි (2020.11.20 දින සිට 2050.11.19 දක්වා ඉදිරියට)

(*ආ*) බදු මුදල ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

(*ඇ*) මෙම ඉඩම ආගමික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඈ*) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කල යුතුය.

(*ඉ*) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(*ඊ*) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(*උ*) ඉඩම බදු දී ඇති කල්හි බදු කරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(*ඌ*) 2020.11.20 සිට අවුරුදු 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(*එ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රනවන්,
සහකාර ඉඩම් කොමසාරිස්.
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි මස 12 වැනි දින,
අංක 1200/6 ඉඩම් මහ ලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-170

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/56052
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/Les/MNN/NewAROW/5

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 176ඩී - පනිච්චියඩි ග්‍රාම නිලධාරී වසමේ තිරායිමඩු ගමේ දළ අනුරේඛණයෙහි ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වන ඉඩම් කොටස සමිති කටයුතු සඳහා කාන්තා සමාජයේ අවශ්‍යතා වෙනුවෙන් පෙනීසිටින සමාජ ජාලයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

උතුරට : රජයේ ඉඩම
නැගෙනහිරට : රජයේ ඉඩම
දකුණට : කෝවිල පාර
බටහිරට : පාර

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* : අවුරුදු පහයි (05) යි (2020.12.11 දින සිට ඉදිරියට)
(ආ) *බදු මුදල* : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.
(ඇ) මෙම ඉඩම සමිති කටයුතු සඳහා මිස වෙනත් කටයුතු සඳහා නොයෙදවිය යුතු ය.
(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.
(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතු ය.
(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.
(උ) ඉඩම බදු දී ඇති කල්හි බදු කරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.
(ඌ) 2020.12.11 සිට අවුරුදු 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.
(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රනවන්,
සහකාර ඉඩම් කොමසාරිස්.
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2021 පෙබරවාරි 12 වන දින,
අංක 1200/6, ඉඩම් මහ ලේකම් කාර්යාලය
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-165

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63776

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහත උපලේඛනයේ විස්තර කෙරෙන රජයේ ඉඩම් කොටස් වාණිජ කටයුතු සඳහා එහි නම් සඳහන් පුද්ගලයින් නමින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* - අවුරුදු තිහයි (30) (2020.12.07 දින සිට වසර 30ක් ඉදිරියට)
*වාර්ෂික බදු මුදල* - 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.
(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2020.12.07 දින සිට අවුරුදු 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සමීර පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*

2021 පෙබරවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

## උපලේඛනය 01

| අනු. අංකය | ඉඩම් කොමසාරිස් ජනරාල් ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛණ අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 4/10/63776 | දොන් චේතිකා හසන්ති මුදලිගේ | කතරගම | අංක 146බී, දෙටගමුව | මැණික්පුරගම | අ.භූ.පි.25 | 4358, 4359 හා 4360න් කොටසක් | අක්. 02 රූඩ් 02 පර්. 09 | උතුරට : ඇල රක්ෂිතය<br>නැගෙනහිරට : එෆ්. ටී. පී. 25හි කැ. අ. 4356,4364<br>දකුණට : එෆ්. ටී. පී. 25හි කැ. අ. 3923, 3922 සහ 3921<br>බටහිරට : එෆ්. ටී.පී. 25 හි කැ. අ. 4358, 4359, 4960, 4361, 4362, 4363 |
| 2 | 4/10/63777 | ලියන ආරච්චිගේ අතුල පෙරේරා | කතරගම | අංක 146සී, කඳසුරිඳුගම | කඳසුරිඳුගම | අ.භූ.පි.25 | 4882, 4881න් කොටසක් | රූඩ් 01 පර්. 11.06 | උතුරට : එච්. ජී. අනුර හිමිකම් කියන III පියවර ඉඩම්<br>නැගෙනහිරට : එච්. ජී. ලක්ෂ්මන් හිමිකම් කියන III පියවර ඉඩම්<br>දකුණට : මාර්ගය<br>බටහිරට : එච්. ආර්. ලීලාවතී හිමිකම් කියන ඉඩම |
| 3 | 4/10/63779 | හේවා රයිගම් කෝරලගේ සම්පත් ගයාන් | කතරගම | අංක 146සී, කඳසුරිඳුගම | ගලපිටගලයාය | අ.භූ.පි.25 | 4798න් කොටසක් | අක්කර 01 | උතුරට : සුගුනසිරිගේ ඉඩම<br>නැගෙනහිරට : මාර්ග රක්ෂිතය<br>දකුණට : කරුණාදාසගේ ඉඩම<br>බටහිරට : සුදත්ගේ ඉඩම |

| අනු. අංකය | ඉඩම් කොමසාරිස් ජනරාල් ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛණ අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | 4/10/63780 | චන්ද්‍රසිරි එදිරිවීර | කතරගම | අංක 146ඩී, කරවිලේ | මයිලගම | අ.හු.පි.25 | 4694 | හෙක්. 0.1047 | උතුරට : කැබලි අංක 4699 සහ 4693 නැගෙනහිරට : කැබලි අංක 4693 සහ 4699 දකුණට : කැබලි අංක 4699 සහ 4695 බටහිරට : කැබලි අංක 4695 සහ 4699 |
| 5 | 4/10/63781 | කන්දේදූරගේ සෝමපාල | කතරගම | අංක 146ඩී, කරවිලේ | සෙල්ලකතරගම | අ.හු.පි.25 | 2248 | පර්. 21.7 | උතුරට : අ.හු.පි. 25 හි කැබලි අංක 2250 නැගෙනහිරට : අ.හු.පි. 25හි කැබලි අංක 2250 දකුණට : අ.හු.පි. 25හි කැබලි අංක 2249 බටහිරට : අ.හු.පි. 25හි කැබලි අංක 2247 |
| 6 | 4/10/63782 | ලේමස්තොට මුදියන්සේලාගේ ජයන්ත කරුණාරත්න බංඩා | කතරගම | අංක 146බී, දෙටගමුව | වල්ලිමාතාගම | අ.හු.පි.25 | 4691 කොටසකි | රූඩ් 02 | උතුරට : එස් වන්නිආරච්චි හිමිකම කියන ඉඩම නැගෙනහිරට : උපතිස්ස හිමිකම් කියන ඉඩම දකුණට : ඩබ්. අල්විස් හිමිකම් කියන ඉඩම බටහිරට : මාර්ගය |
| 7 | 4/10/63783 | පිංදෙනියගේ එඩ්රල් නිසන්ත ගුණසේකර | කතරගම | අංක 146ඩී, දෙටගමුව | බෝධිරාජපුර | අ.හු.පි.25 | 4357 කොටසකි | රූඩ් 02 | උතුරට : මාර්ග රක්ෂිතය නැගෙනහිරට : ඩබ්. කේ. ගිරිගෝරිස් හිමිකම් කියන ඉඩම දකුණට :ඇළ රක්ෂිතය බටහිරට : සෙනරත් අමරසිංහ හිමිකම් කියන ඉඩම |
| 8 | 4/10/63784 | මල්ලිකා ආරච්චිගේ මානෙල් | කතරගම | අංක 146ඩී, කරවිලේ | කරවිලේ | අ.හු.පි.25 | 3602 කොටසකි | පර්. 37 | උතුරට : කේ. පී. ශාන්ත සහ එස්. ඩබ්. පී. ටී. ප්‍රියදර්ශනගේ ඉඩම නැගෙනහිරට : එස්. ඩබ්. පී.ටී. ප්‍රියදර්ශනගේ ඉඩම ප්‍රවේශ මාර්ගය දකුණට : ප්‍රවේශ මාර්ගය සහ එල්. එච්. සරනදසගේ ඉඩම බටහිරට : පී. ඒ. යුරේශ්ගේ ඉඩම |

| අනු. අංකය | ඉඩම් කොමසාරිස් ජනරාල් ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛණ අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9 | 4/10/63785 | නිලන්ති අනෝජා ලියනගේ | කතරගම | අංක 146බී, දෙටගමුව | බෝධිරාජපුර | අ.හු.පි.25 | 4550න් කොටසක් | අක් 01 පර්. 14 | උතුරට : බී. එස්. ජයසේකරගේ ඉඩම<br>නැගෙනහිරට : පාර රක්ෂිතය<br>දකුණට : පාර රක්ෂිතය<br>බටහිරට : පාර සහ එස්. ජයසේකරගේ ඉඩම |
| 10 | 4/10/63786 | ඩොරින් කුඩාග මගේ | කතරගම | අංක 146, කතරගම | ගාමිණීපුර | අ.හු.පි.25 | 3665න් කොටසක් | රූඩ් 02 පර්. 37.4 | උතුරට : පාර (ප්‍රාදේශීය සභාව)<br>නැගෙනහිරට : පාර (ප්‍රාදේශීය සභාව) සහ කේ. කේ. සුනිල් හිමිකම් කියන ඉඩම<br>දකුණට : කේ. කේ. සුනිල් සහ කේ. එම්. සුනිල් හිමිකම් කියන ඉඩම<br>බටහිරට : ඒ. එම්. සුනිල් හිමිකම් කියන ඉඩම සහ පාර (ප්‍රාදේශීය සභාව) |
| 11 | 4/10/63787 | අතුලුවගේ මල්ලිකා | කතරගම | අංක 146ඒ, සෙල්ලකතරගම | සෙල්ලකතරගම | අ.හු.පි.25 | 3859න් කොටසක් | රූඩ් 02 පර්. 18.4 | උතුරට : රංගේ නිහාල්ගේ ඉඩම<br>නැගෙනහිරට : ඇළ සහ පාර රක්ෂිතය<br>දකුණට : ජිනදාස රත්නායකගේ ඉඩම<br>බටහිරට : ඩබ්. ඒ. ඩබ් දමයන්තිගේ ඉඩම |
| 12 | 4/10/63788 | රසිකා ශිරෝමණී කන්දමුල්ල | කතරගම | අංක 146බී, දෙටගමුව | මැණික්පුරගම | අ.හු.පි.25 | 3847න් කොටසක් | අක්. 01 පර්. 04 | උතුරට : ජගත් රණසිංහගේ ඉඩම<br>නැගෙනහිරට : පියදස, ගිරිගෝරිස් යන අයගේ ඉඩම හා ප්‍රවේශ මාර්ගය<br>දකුණට : ලතා යන අයගේ ඉඩම<br>බටහිරට : ලියනවඩුගේ කපිල සහ ජගත් රණසිංහගේ ඉඩම |
| 13 | 4/10/63789 | කන්ද උඩගේ ෂර්ලින් ද සිල්වා | කතරගම | අංක 146, කතරගම | ගාමිණීපුර | අ.හු.පි.25 | 4650න් කොටසක් | පර්. 28.8 | උතුරට : ප්‍රේමසිරි පතිරත්නගේ ඉඩම<br>නැගෙනහිරට : සම්පත් දර්ශන බණ්ඩාගේ ඉඩම<br>දකුණට : කිරිවෙහෙරට යන පාර හා මැණික් ගඟ රක්ෂිතය<br>බටහිරට : නිවාස වලට යන 12 පාර |

| අනු. අංකය | ඉඩම් කොමසාරිස් ජනරාල් ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛණ අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | 4/10/63790 | බමුණුසිංහ ආරච්චිගේ චන්න ජයනාත් | කතරගම | අංක 146 ඩී, කරවිලේ | මයිලගම | අ.භූ.පි.25 | 3576න් කොටසක් | පර්. 24 | උතුරට : එස්. එල්. ධනරංජන හා මාර්ග රක්ෂිතය<br>නැගෙනහිරට : මාර්ග රක්ෂිතය සහ ඒ. එම්. ඒ. හින්නිහාමි<br>දකුණට : ඒ. එම්. ඒ. හින්නිහාමි හා ඇළ රක්ෂිතය<br>බටහිරට : ඇළ රක්ෂිතය හා එස්. එල්. ධනරංජන |
| 15 | 4/10/63791 | හීංදෙනි පතිරාජගේ දෙන් ගාමිණි කුමාර | කතරගම | අංක 146 එ්, සෙල්ලකතරගම | සෙල්ලකතරගම අක්කර විස්ස | අ.භූ.පි.25 | 50107න් කොටසක් | අක්. 01 පර්. 30.7 | උතුරට : මාර්ගය (ප්‍රාදේශීය සභා) රක්ෂිතය<br>නැගෙනහිරට : කේ. එච්. පැලිස් හිමිකම් කියන ඉඩම<br>දකුණට : මාර්ග රක්ෂිතය<br>බටහිරට : මාර්ග රක්ෂිතය |
| 16 | 4/10/63792 | අරන්ගල ආරච්චිලාගේ සුනිල් මුණසිංහ | කතරගම | අංක 146 බී, දෙටගමුව | බෝධිරාජපුර | අ.භූ.පි.25 | 4374 | අක්. 02 | උතුරට : කැබලි අංක 4366, 4373 සහ 4267<br>නැගෙනහිරට : කැබලි අංක 4267 සහ 4375<br>දකුණට : කැබලි අංක 4375<br>බටහිරට : කැබලි අංක 4375, 4371, 4366 සහ 4373 |
| 17 | 4/10/63793 | ධනපාල බෝග හවත්ත | කතරගම | අංක 146 ඩී, කරවිලේ | මයිලගම | අ.භූ.පි.25 | 850,848 හි කොටසක් | අක්. 01 පර්. 28.5 | උතුරට : එෆ්. ටී. පී. 25 කැබලි අංක 849 සහ ප්‍රධාන මාර්ග රක්ෂිතය<br>නැගෙනහිරට : එෆ්. ටී. පී. 25 කැබලි අංක 851 සහ 852<br>දකුණට : එෆ්. ටී. පී. 25 කැබලි අංක 852 සහ පරණ කරවිලේ පාර<br>බටහිරට : එෆ්. ටී. පී. 25 කැබලි අංක 849 සහ 848 ඉතිරි කොටස |

| අනු. අංකය | ඉඩම් කොමසාරිස් ජනරාල් ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛණ අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | 4/10/64801 | මුදලිගේ වීරනාථ සමරවික්‍රම | කතරගම | අංක 146ඩී, කරවිලේ | මයිලගම | අ.භූ.පි.25 | 825න් කොටස | රූඩ් 03 පර්. 27.08 | උතුරට : එස්. අබේසිරිවර්ධනගේ ඉඩම (කැ.අ. 865 කොටසක්)<br>නැගෙනහිරට : හෙට්ටිආරච්චිගේ එවානිස් ඉඩම (කැ.අ. 824)<br>දකුණට : ප්‍රධාන පාර රක්ෂිතය (කැ. අ. 833)<br>බටහිරට : තිබලත් රත්නායක පද්මතිලකගේ ඉඩම (කැ. අ. 826) |
| 19 | 4/10/64802 | මහවත්ත කොඩිතුවක්කුගේ ජයන්ත | කතරගම | අංක 146ඒ, සෙල්ලකතරගම | සෙල්ලකතරගම | අ.භූ.පි.25 | 5130න් කොටසක් | පර්. 06 | උතුරට : එච්. ඩබ්. විජේසිරිගේ ඉඩම හා ජේ. පී. ගුණවතීගේ ඉඩම<br>නැගෙනහිරට : ජේ. පී. ගුණවතීගේ ඉඩම හා ඩබ්. ඩැනිස්ටර් ද සිල්වාගේ ඉඩම<br>දකුණට : මාර්ග රක්ෂිතය<br>බටහිරට : එච්. ඩබ්. විජේසිරිගේ ඉඩම හා සහ ඩබ්. සමන්තගේ ඉඩම |

02-193